නිපුණතාව 5.0 - ව්‍යාපාරික අවදානමට මුහුණ දීමේ අවදානම ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 5.3 - සිද්ධි සංයුක්ත කිරීමට කුලක කර්ම භාවිත කරයි.

1.)සරල සිද්ධි හා සංයුත සිද්ධි යන්න පැහැදිලි කරන්න.

2.)1 සිට 6 තෙක් අංක යෙදූ සමබර දාදු කැටයක් හා සමබර කාසියක් එකවර උඩ දැමීමේ පරීක්ෂණයට අදාළව එක් එක් අවස්ථා සම්මත සංකේත ඇසුරෙන් ප්‍රකාශ කර වෙන් රූප සටහන් ඇඳ දක්වන්න.

1.කාසියේ සිරස ලැබීමේ සිද්ධිය - A
2.දාදු කැටයේ 5 වැටීමේ සිද්ධිය - B
3.කාසියේ සිරස වැටීම හෝ දාදුවේ 5 අංකය වැටීම.
4.කාසියේ සිරස හා දාදුවේ 5 අංකය ලැබීමේ සිද්ධිය
5.මෙම පරීක්ෂණයට අදාළව කාසියේ සිරස නොවැටීමේ සිද්ධිය
6.කාසියේ සිරස හෝ දාදුවේ අංක 5 අගය නොලැබීම.
7.කාසියේ සිරස ලැබීම සහ දාදුවේ අංක 5 ලැබීම යන සිද්ධි දෙකම එකවිට සිදු නොවීම.
8.කාසියේ සිරස වැටීම හා දාදුවේ අංක 5 නොලැබීමේ සිද්ධිය
9.දාදුවේ 5 වැටීම සහ කාසියේ සිරස නොවැටීමේ සිද්ධිය